දෙපාර්තමේන්තු චක්‍රලේඛන - 18/2018

මාගේ අංක - බ/13/02(i)/පොදු/2018.
බන්ධනාගාර මූලස්ථානය.
කොළඹ 09.
2018-12-04 දින දී.

සියළුම මාණ්ඩලික නිළධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

<u>2018 මුදල් වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම.</u>
<u>බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුම.</u>

2018.12.31 වන දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන යන ආයතන ගිණුම් පියවීම සම්බන්ධයෙන් පහත සඳහන් උපදෙස් හා නියෝග පරිදි ක්‍රියාකල යුතු බව අවධාරණය කරනු ලැබේ.

1. 2018 දෙසැම්බර් මාසය සඳහා ප්‍රතිපාදන හා අක්මුදල් ලබා ගැනීම.

   i. 2018 වර්ෂය වෙනුවෙන් ඔබ ආයතනයට ලබා දෙන ප්‍රතිපාදන සීමාව ඉක්මවා කිසිදු ගෙවීමක් නොකිරීමට ආයතන ප්‍රධානීන් තරයේ වගබලා ගත යුතුය.යම් හෙයකින් 2018 වර්ෂය සඳහා ලබා දුන් ප්‍රතිපාදන ඉතිරි වන්නේ නම් ඒ පිළිබඳව දෙසැම්බර් මස තුන්වන සතියට පෙර කඩිනමින් බන්ධනාගාර කොමසාරිස්(මුදල්) වෙත විද්‍යුත් තැපැල් (commfinance@prison.gov.lk) මඟින් හෝ ෆැක්ස් මඟින් දැනුම් දීමට කටයුතු කළ යුතුය.

   ii. දෙපාර්තමේන්තුව සතු ප්‍රතිපාදන හා අක්මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගෙන නිරවුල් කල හැකි සියළුම බිල්පත් නිරවුල් කිරීමට දෙපාර්තමේන්තුවේ ගෙවීම් භාරව කටයුතු කරන සියළුම නිළධාරීන් වග බලා ගත යුතු අතර, ලබා දී ඇති සියළුම අත්තිකාරම් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් නොදැරීමටත් ,වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරි නොවන ලෙස වියදම් දැරීමටත් කටයුතු කල යුතුය.

2. 2018 මුදල් වර්ෂයට අදාළව මුදල් පොත පියවීම.

   i. බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුම යටතේ ඔබ වෙත වෙන් කර දී ඇති අක්මුදල්, අදාළ ගෙවීම් සිදු කිරීමෙන් පසු 2018.12.28 දිනට ඇති ශේෂය "බන්ධනාගාර කොමසාරිස් ජනරාල් කර්මාන්ත" නමින් ලියන ලද චෙක්පතකින් බන්ධනාගාර මූලස්ථානයට එවිය යුතුයි.

   ii. 2018-12-28 වන සිකුරාදා දින සියළුම බන්ධනාගාර ආයතන විසින් එදින දහවල් 12.00 ට මුදල් පොත වැසීමට කටයුතු කල යුතු වේ. 2018.12.31 දින ගිණුම අංශ නිළධාරීන් මෙන්ම ගිණුම් පියවීමට බලයලත් නිළධාරීන් ගිණුම් පියවීම අවසන් වන තෙක් ආයතනය තුල එදිනට රැඳී සිටීමට වග බලාගත යුතු වේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුව උප ආයතන රාශියකින් සමන්විත වන බැවින් හා ගිණුම් පියවීම ඉතා සංකීර්ණ වන බැවින් ද මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කල යුතුවේ.

iii. 2018 වර්ෂය සඳහා මුදල් පොත පියවනු ලබන සියළුම බන්ධනාගාර ආයතනයන් මුදල් පොත් පියවන දිනට මුදල් පොතේ ඉතිරි ශේෂයේ වටිනාකම "බන්ධනාගාර කොමසාරිස් ජනරාල් - කර්මාන්ත" බොරැල්ල මහජන බැංකු ශාඛාවේ ගිණුම් අංක 078-1001-09026583 ට චෙක්පතක් ලියා මුදල් පොත ශූන්‍ය කළ යුතුය. 2018.12.28 දින මුදල් පොත පියවා 28 වන දින ප.ව.03.00 ට පෙර ඉහත ගිණුමට අදාළ චෙක්පත බැර කළ යුතුය. සියළුම ආයතන විසින් එම චෙක්පතේ ඡායා පිටපතක් හා බන්ධනාගාර කොමසාරිස් ජනරාල් - කර්මාන්ත නිල බැංකු ගිණුමට (078-1001-09026583) බැර කල බවට තහවුරු කෙරෙන තැම්පතු පතෙහි (Cheque Deposit Slip) ඡායා පිටපතක්, ආවරණ ලිපිය සමඟ විද්‍යුත් තැපැල (commfinance@prison.gov.lk) මඟින් හෝ ෆැක්ස් මඟින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත එදිනම එවීමට කටයුතු කළ යුතු අතර ඔබ විසින් එම තොරතුරු මූලස්ථානය වෙත ලද බවට තහවුරු කල ගත යුතුය. තවද මුදල් පොතේ ශේෂයක් නොමැති නම් ඒ පිළිබඳ ලිඛිතව දැනුම් දීමට ඉහත පරිදි කටයුතු කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් ඒ ඒ ආයතනයන්හි අධිකාරීන් / සහකාර අධිකාරීන් පෞද්ගලිකවම තම අවධානය යොමු කළ යුතු බව අවධාරණය කෙරේ..

iv. බන්ධනාගාර ආයතන වල ගිණුම් පියවීම සම්බන්ධයෙන් බලය පැවරූ නිළධාරීන්ගේ නාම ලේඛණය අමුනුම් අංක 01 හි දක්වා ඇත. අදාළ නිළධාරීන් ඒ ඒ බන්ධනාගාර ආයතන වල මුදල පොත් වැසීමේ වගකීම දැරිය යුතුය. 2018 වර්ෂය වෙනුවෙන් මුදල් පොත් වැසීමෙන් පසු කිසිදු ගෙවීමක් මුදල් පොතේ සටහන් කල නොහැකි වන පරිදි එක් එක් මුදල් පොත් වල එදිනට සටහන් කෙරෙන අවසාන සටහනට යටින් රතු තීන්තෙන් ඉරක් ඇඳ තම නම , තනතුර, අත්සන, දිනය හා වේලාව සටහන් කර 2018 වර්ෂයේ මුදල් පොත නියමිත පරිදි වැසූ බවට සටහන් තැබිය යුතුය.

v. 2019 වර්ෂයට අදාල වන වියදම් සඳහා අවශ්‍ය අක්මුදල් හා ප්‍රතිපාදන බන්ධනාගාර මූලස්ථානය මඟින් 2019 ජනවාරි මාසයේ දී ලබා දෙන බැවින් කිසිදු අග්‍රිම ශේෂයක් බන්ධනාගාර ආයතන විසින් රඳවා තබා ගැනීමට කටයුතු නොකල යුතු බව අවධාරණය කරමි.

3. **මාසික ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

i. 2018 දෙසැම්බර් මස ගිණුම් සාරාංශය 2019-01-03 වන දිනට පෙර ලබා දිය යුතුය. පළමු වන ගිණුම් සාරාංශයේ යම් කිසි ගිණුම්කරණ දෝෂයක් නිවැරදි කිරීම හෝ හරස් සටහන් මඟින් කරනු ලබන ගෙවීමක් ගිණුම් ගත කිරීමට ඇත්නම් ඒ සඳහා පරිපූරක ගිණුම් සාරාංශයක් ඉදිරිපත් කල හැක. පරිපූරක ගිණුම් සාරාංශය 2018-01-10 වන දිනට පෙර ලබා දිය යුතුය.

ii. ගිණුම් පියවීමේ කටයුතු සම්බන්ධව යම් පැහැදිලි කර ගැනීමක් වෙතොත් දූරකථන අංක 011 - 4677116/ 011 - 2696536 මඟින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) අමතන මෙන් කාරුණිකව දන්වමි.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

එච්.එම්.එන්. සී. ධනසිංහ,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත :- 01. විගණකාධිපති
02. බන්ධනාගාර කොමසාරිස් (අභ්‍යන්තර විගණන)
03. බන්ධනාගාර කොමසාරිස් (කර්මාන්ත)

ඇමුණුම 01

2018 වර්ෂයේ ගිණුම් පියවීම සඳහා බලය පැවරූ නිළධාරීන්ගේ නාම ලේඛණය
බන්ධනාගාර දෙපාර්තමේන්තුව

| අනු අංකය | නිළධාරියාගේ නම | තනතුරු නාමය | ආයතනය |
|---|---|---|---|
| 01 | එච්.සී.ඩබ්.කාරියවසම් | බන්ධනාගාර කොමසාරිස් (මුදල්) | මූලස්ථානය |
| 02 | ටී.අයි.උඩුවර | බන්ධනාගාර අධිකාරි | වැලිකඩ |
| 03 | එල්.ජේ.එම්.කේ.බණ්ඩාර | බන්ධනාගාර අධිකාරි | කොළඹ රිමාන්ඩ් |
| 04 | කේ.ඒ.එස්.කොඩිතුවක්කු | බන්ධනාගාර අධිකාරි | මහර |
| 05 | ආර්.එම්.එස්.බන්ඩාර | බන්ධනාගාර අධිකාරි | බෝගම්බර |
| 06 | යූ.ජී.ඩබ්.තෙන්නකෝන් | සහකාර බන්ධනාගාර අධිකාරි | පල්ලේකැලේ |
| 07 | එස්.ආර්.ගලප්පත්ති | සහකාර බන්ධනාගාර අධිකාරි | අනුරාධපුරය |
| 08 | ඩබ්.ජී.එන්. ප්‍රනාන්දු | සහකාර බන්ධනාගාර අධිකාරි | බදුල්ල |
| 09 | ඒ.සී. ගජනායක | සහකාර බන්ධනාගාර අධිකාරි | තල්දෙන |
| 10 | එස්.වී.එච්. ප්‍රියංකර | සහකාර බන්ධනාගාර අධිකාරි | වීරවිල |
| 11 | ඒ.ඩබ්.එස්. ධම්මික | සහකාර බන්ධනාගාර අධිකාරි | තංගල්ල |
| 12 | බී.එම්.වී.ජී.ඒ.කේ.බස්නායක | සහකාර බන්ධනාගාර අධිකාරි | කුරුවිට |
| 13 | ඩී.ආර්.ඩී.දිසානායක | සහකාර බන්ධනාගාර අධිකාරි | දළුපොත |
| 14 | එල්.පී.එම්. කරුණාරත්න | සහකාර බන්ධනාගාර අධිකාරි (වැ.ආ) | බූස්ස |
| 15 | යූ.බී.වලිසුන්දර | සහකාර බන්ධනාගාර අධිකාරි | වටරැක |
| 16 | එච්.ඒ.එම්.එස්.බී.සේනානායක | බන්ධනාගාර අධිකාරි | වාරියපොළ |
| 17 | ඩබ්.ඒ.ඩී.සී.කරුණාසේකර | සහකාර බන්ධනාගාර අධිකාරි | මාතර |

❖ යම් හෙයකින් ඉහත බලය පැවරූ නිළධාරියෙකු ස්ථාන මාරු නියොගයක් මත බන්ධනාගාර ආයතනය මාරු වන්නේනම් ස්ථාන මාරු නියෝගය අනුව කටයුතු කල යුතුය.